**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීමේ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සංස්ථා භාරය විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයටපිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශසමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත්කර නොතිබුණි.

**1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

රු. 6,080,248 හා රු. 5,032,720 ක් ලෙස ශේෂපත්‍රයේ දක්වා තිබුභාණ්ඩාගාරබිල්පත් හා භාණ්ඩාගාරබැඳුම්කරවල පිරිවැය පිළිවෙළින් රු. 6,569,961 ක් හා රු. 5,030,355 ක්වූ අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතිඅගයයන්ලබාගත්ආකාරය පිළිබඳ තහවුරු කිරීම්විගණනයටඉදිරිපත් නොවීය.

**1.2.3 ගෙවිය යුතුගිණුම්**

රු. 247,696 ක්ව ගෙවිය යුතු ආදායම් බදු මුදල 2007 වර්ෂයට පෙරසිටඉදිරියටගෙන ආ ශේෂයක් බවනිරීක්ෂණය විය.

**1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

රු. 5,032,720 ක්වූ භාණ්ඩාගාරබැඳුම්කරසහ රු. 400,000 ක්වූ ස්ථාවර තැන්පතුසඳහා 2011 දෙසැම්බර් 31 දිනට ශේෂසනාථකිරීම ඉදිරිපත්කර නොතිබුණි.

**1.2.5 නීති ,රීති , රෙගුලාසි හා කළමනාකරණතීරණවලටඅනුකූල නොවීම**

විගණනයේදීනිරීක්ෂණය වූ නීති ,රීති , රෙගුලාසි හා කළමනාකරණතීරණවලටඅනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණතීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| 2002 ජුනි 12 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තියේ (ආ) | දෙසැම්බර් 31 දිනට රු. 400,000 ක් වූ ස්ථාවර තැන්පතු අයෝජන සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුවසංස්ථා භාරයේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 73,963 ක ඌනතාවයක්වූ අතර ,ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ වූ අතිරික්තය රු. 345,997 ක් වුයෙන්මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 419,960 ක පිරිහිමක් දක්නට ලැබුණි. මෙම පිරිහිමට ආයෝජන මත වූ පොලි ආදායම අඩුවීම මුලිකවම බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

1998 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ වර්ෂ 13 ක් තුළදී චිත්‍රපටකලාකරුවන් හා චිත්‍රපටකාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප්, වෛද්‍යාධාර හා මරණාධාර වශයෙන එකතුව රු. 17,685,980 ක් ප්‍රදානය කරතිබුණි.

මේ පිළිබඳව පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ විශ්‍රාමිකයන් 49 දෙනෙකු වෙනුවෙන් විශ්‍රාම වැටුප්වශයෙන් රු. 1,134,000 ක් ද, වර්ෂය තුළදී මියගිය විශ්‍රාමිකයින් 02 දෙනෙකුද ඇතුළුව කලා ශිල්පීන් පස් දෙනෙකු සඳහා මරණාධාර ලෙස රු. 50,000 ක් ද , වෛද්‍යාධාර ලෙස පුද්ගලයකුට රු. 5,000 ක් ද වශයෙන් එකතු වටිනාකම රු.1,189,000 ක් ගෙවා තිබුණි. 2004 සැප්තැම්බර් 21 දින පැවැත්වූ 79 වැනිපාලක මණ්ඩල රැස්වීමේදීඅනුමත කළ කලාකරුවන් 13 දෙනෙකුගෙන් 04 සඳහා පමණක් විශ්‍රාම වැටුප් ගෙවා තිබුණු අතර භාරකාර මණ්ඩලය පත්කරතිබුණද 2011 වර්ෂය

තුලඉතිරි 09 දෙනාට විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතුකර නොතිබුණි. මේ හැර අළුතින් විශ්‍රාම වැටුප් ප්‍රදානයන් කිරීමටදකටයුතුකර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 3.2.1 පනතේ අරමුණු සාක්ෂාත්කර නොගැනීම

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ) 1986 අංක 3 දරන චිත්‍රපටකලාකරුවන් හා චිත්‍රපටකාර්මිකයන්සඳහා වූ ජාතික චිත්‍රපටසංස්ථා භාරය පනතේ 3 වන වගන්තියට අනුව භාරයෙහි පරිපාලනය, කළමනාකරණය, සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලය පත්කරතිබුණද 2011 වර්ෂය තුලදී රැස්වතිබුණේ එක්වරක් පමණි.

(ආ) 1986 අංක 3 දරන චිත්‍රපටකලාකරුවන් හා චිත්‍රපටකාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපටසංස්ථා භාරය පනතේ 5 වන වගනතිය යටතේවූ පහත සඳහන් පරමාර්ථ 2011 වර්ෂයේදීද, ඉටුකර ගෙන නොතිබුණි.

(i) චිත්‍රපටකලාකරුවන්ට හා කාර්මිකයන්ටආධාරපිණිසයහසාධකඅරමුදල්, ඉතිරිකිරීමේඅරමුදල්,ඉතිරිකිරීමේ හෝ සකසුරුවම් සමිතිසහ වෙනත්සමාන යෝජනා ක්‍රමද ක්‍රියාත්මකකිරීම.

(ii) සුදුසුකම්ලැබූ චිත්‍රපටකලාකරුවන්ට හෝ කාර්මිකයන්ට වයස අවුරුදු හැටට එළඹීමෙන් පසු ණයක්, දීමනාවක්, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් පිරිනැමීම.

මේවා ක්‍රියාත්මක කිරීමටප්‍රමාණවත් අරමුදල් භාරය වෙත නොමැති බවසභාපතිවරයා දැනුම් දීඇත.

### 3.2.2 ක්‍රියාත්මක නොවූ භාරකාර මණ්ඩලතිරණ

භාරය සතු ස්ථාවර තැන්පතුවලින් ලැබෙන වාර්ෂික පොලිය හා චිත්‍රපට සංස්ථාවෙන් භාරයට ලැබෙන රු. 200,000 මුදලින් විශ්‍රාම ලාභීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවනුලබනඅතර , භාරයේ මූල්‍ය තත්ත්වය තවදුරටත්වර්ධනය කරගැනීම සඳහා 2004 සැප්තැම්බර් 21 දින පැවැති 79 වන භාරකාර මණ්ඩල රැස්වීමේදී ගනුලැබූ වැදගත් තිරණ රාශියක් 2011 වර්ෂයේදීද ක්‍රියාත්මකකර නොමැති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය පසුගිය විගණන වාර්තාවලින්ද පෙන්වා දි තිබු නමුත් එම කාර්යයන් සිදුකිරීම සඳහා භාරය විසින් ප්‍රමාණවත් අවධානයක් දක්වා නොතිබුණි.

### 3.2.3 රුක්මණී දේවි අනුස්මරණ අරමුදල

රු. 462,778 ක්වු රුක්මණි දේවි අනුස්මරණ අරමුදල උපයෝගීකර ගෙන ගායකයකුට ඉන්දියාවේ "පුනා" චිත්‍රපට ආයතනයේ පශ්චාත් උපාධියක් ලබාදීම සඳහා යෝජිත ශිෂ්‍යත්වක්‍රමය 1985 වර්ෂයේ සිට සමාලෝචිතවර්ෂය දක්වා ක්‍රියාත්මකකර නොතිබුණි.

**3.2.4 ආර්ථික නොවූ ගනුදෙණු**

--------------------------------

1986 අංක 3 දරන චිත්‍රපටකලාකරුවන් හා කාර්මිකයින් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාර පනතේ 5 වන වගන්තියෙන් දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කල යුතු රීති මාලාවේ 12 ප්‍රකාරව අරමුදල වැඩි දියුණුකර ගැනිමට හැකිවන පරිදි මාසිකව ගෙවීමට ප්‍රමාණවත් මුදල් පමණක් රඳවාගෙන සෙසු මුදල් ඵලදායී ආයෝජනයක යෙදවිය යුතු වූවත් මාසයක සාමාන්‍ය වියදම රු. 100,000 හා රු. 150,000 අතර ප්‍රමාණයක් වූ අතර මසකටසාමාන්‍යයෙන රු. මිලියන 1 සිට1 ½ දක්වා වූ අතිරික්ත මුදල් ප්‍රමාණයක් බැංක ජංගම ගිණුම්වල රඳවා ගෙනතිබුණි.

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

----------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශනඉදිරිපත්කිරීම**

-------------------------------

අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සකස්කර විගණකාධිපති වෙත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, සංස්ථා භාරය විසින් 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුණේ මාස 02 ක්ප්‍රමාද වී 2012 මැයි 04 දිනදිය.

**4.2 සංයුක්ත සැලැස්ම**

--------------------

2003 ජුනි 02 දින හා අංක. පර්ඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ජේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

------------------------

සංස්ථා භාරයේ ගිණුම් කටයුතු අභ්‍යන්තර විගණනයකට ලක්කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු භාරයේ සභාපතිවරයා වෙත වර්න්වර දන්වන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම

(ඈ) ගිණුම් පොත්පත් ලේඛනනඩත්තුව

(ඉ) ආයෝජන